වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

## පොල් වගාකිරීමේ මණ්ඩලය පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර :** සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) II ශ්‍රේණිය
**සේවා ස්ථානය :** ප්‍රධාන කාර්යාලය - **තනතුරු** - 01

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ වාණිජ්‍ය විශේෂ උපාධිධාරියෙකු වීම හා කළමනාකාර (Managerial) මට්ටමේ වසර 03 ක අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද.

**වැටුප් කාණ්ඩය** : MM 1-3

**වැටුප් පරිමාණය** : රු. 96,650/ - (2,480X10) (3,450X15) 173,200/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2025 වර්ෂයට | 2026 වර්ෂයට | 2027 වර්ෂයට |
|---|---|---|
| රු. 75,143/- | රු. 85,896/- | රු. 96,650/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුර :** ප්‍රාදේශීය කළමනාකරු II ශ්‍රේණිය
**සේවා ස්ථානය :** සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා
**තනතුරු** : 01

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය/ කෘෂිකර්ම උපාධිය.

**සහ**

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක සේවා පළපුරුද්ද.

**වැටුප් කාණ්ඩය** : MM1-1

**වැටුප් පරිමාණය** : රු. 91,690/ - (2,480X10) (3,450X15) 168,240/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2025 වර්ෂයට | 2026 වර්ෂයට | 2027 වර්ෂයට |
|---|---|---|
| රු. 71,730/- | රු. 81,710/- | රු. 91,690/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුර :** විෂයානුබද්ධ නිලධාරී (සත්ව පාලන) II ශ්‍රේණිය
**සේවා ස්ථානය :** පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය
**තනතුරු** : 01

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී සත්ව පාලනයට අදාළ විශේෂ උපාධියක්/ සත්ව පාලන විෂයට විශේෂිතව ලබාගත් විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධියක්

සමග

රාජ්‍ය/ මණ්ඩල/ සංස්ථා හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පුහුණු/ අධ්‍යයන/ පර්යේෂණ/ ව්‍යාප්ති කටයුතු පිළිබඳ වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : JM 1-2

වැටුප් පරිමාණය : රු.74,010/-(1,360X10) (2,040X18) 124,330/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2025 වර්ෂයට | 2026 වර්ෂයට | 2027 වර්ෂයට |
|---|---|---|
| රු. 59,552/- | රු. 66,781/- | රු. 74,010/- |

වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(උක්ත තනතුරු සඳහා ජීවන වියදම් දීමනාව රු.17,800/- ඇතුළු තනතුරට අදාළ රජයේ අනෙකුත් දීමනා හිමි වේ.)

**වෙනත් කොන්දේසි :-**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- ඒ අනුව 2025.06.13 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් සුදුසු ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ.
- එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.
- සියලුම අයදුම්පත් 2025.06.13 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**සභාපති**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**

ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එමෙන්ම එසේ බාගත කරගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකරන ලෙස දන්වමි.

https://coconutsrilanka.lk/